www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

**Royal College - Colombo 07**

රාජකීය විද්‍යාලය - කොළඹ 07

**Grade 9 – First Term Test – April 2019**

**පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 9 ශ්‍රේණිය**

කාලය : පැය 2
**Time :2 hour**

# Geogaphy– I

# භූගෝල විද්‍යාව– I

Name :- .................................................... Grade : -................ Index number:-....................

❖ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

- **අංක 1-10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. ආසියා මහද්වීපයේ නැගෙනහිර හා බටහිර මායිම් පිළිවෙළින් දක්වා ඇති පිළිතුර,
   (1) පැසිපික් සාගරය හා යුරෝපා මහද්වීපය
   (2) අත්ලාන්තික් සාගරය හා යුරෝපා මහාද්වීපය
   (3) ඉන්දියන් සාගරය හා අප්‍රිකා මහාද්වීපය
   (4) අත්ලාන්තික් සාගරය හා අප්‍රිකා මහාද්වීපය

2. ආසියා මහාද්වීපයට අයත් ප්‍රමාණයෙන් කුඩා දූපතකි
   (1) අන්දමන් (2) ජපන් (3) පිලිපීනය (4) ශ්‍රී ලංකාව

3. සමස්ත පෘථිවි තලයෙන් ආසියා මහාද්වීපයට අයත් ගොඩබිම් ප්‍රමාණය,
   (1) 5.6% (2) 44.6% (3) 8.7% (4) 42.8%

4. ගෝබි කාන්තාරයෙහි ඇති සුවිශේෂත්වය වන්නේ,
   (1) වගාව සඳහා ඉතා සරුසාර භූමියක් වීම
   (2) උෂ්ණත්වය ඉතා අඩුම ප්‍රදේශයක් වීම
   (3) ඉතා අධික වර්ෂාපතනයක් ලැබෙන ප්‍රදේශයක් වීම
   (4) වර්ෂාව අඩුවෙන්ම ලැබෙන ප්‍රදේශයක් වීම

5. ජන සංඛ්‍යා විශාලත්වය අනුව ලෝක ජන සංඛ්‍යාවෙන් 60% පමණ ජීවත වන මහාද්වීපය වන්නේ,
   (1) දකුණු ඇමරිකාව (2) ආසියාව (3) අප්‍රිකාව (4) යුරෝපය

6. ශ්‍රී ලංකාවේ උපරිම දිග වන 432km ගණනය කරනු ලබන්නේ,
   (1) කොළඹ සිට සංගමන්කන්ද තුඩුව දක්වා (2) පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා
   (3) කොළඹ සිට පේදුරු තුඩුව දක්වා (4) දෙවුන්දර තුඩුවේ සිට කොළඹ දක්වා



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

7. ඉන්දු ගංගා නිම්න වාරි පද්ධතිය මගින් හෙක්ටයාර් මිලියන 16ක පමණ කෘෂි බිම් ප්‍රමාණයක් වගා කරනු ලබන රට,
   (1) පාකිස්ථානය (2) ඉන්දියාව
   (3) බංග්ලාදේශය (4) නේපාලය

8. ■ ඉන්ධන කාර්යක්ෂමතාව
   ■ සුඛෝපබෝගී බව
   ■ අතිරේක අංගෝපාංග වලින් සමන්විත වාහන
   නිෂ්පාදනය කරන ආසියාතික රට,
   (1) ඇමරිකා එක්සත් ජනපදය (2) ජපානය
   (3) ඉන්දියාව (4) බ්‍රිතාන්‍ය

9. ඉරාකයේ පිහිටා තිබූ පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාරය වන්නේ,
   (1) මොහොන්දජාරෝ හරප්පා (2) යුප්‍රටීස් ටයිග්‍රීස්
   (3) නයිල් නිම්න (4) හොවැංහෝ

10. මොංගොලොයිඩ් හා කෝකසොයිඩ් මානව වර්ග දෙක ජීවත් වන රටවල් පිළිවෙලින් දැක්වෙන පිළිතුර.
   (1) ජපානය, සිංගප්පූරුව (2) පාකිස්ථානය, ඇෆ්ගනිස්ථානය
   (3) පාකිස්ථානය, චීනය (4) චීනය, ඉන්දියාව

- **අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශන නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද දී ඇති වරහන තුළ යොදන්න.**

11. නිවර්තන දේශගුණික කලාපය පිහිටා ඇත්තේ සමකය දෙපස ය. ( )
12. තුන්ද්‍රා දේශගුණය ව්‍යාප්තව ඇත්තේ ශීත කලාපය තුල ය. ( )
13. ඉන්දු ගංගාව මුහුදට වැටෙනුයේ කල්කටා නගරය ආශ්‍රයෙනි. ( )
14. අන්යාන් නගරය අතීතයේ දී හොවැංහෝ ගඟ අසල පිහිටි දියුණු නගරයකි. ( )
15. භූතානය ආසියා මහාද්වීපයේ පිහිටි අධික ජන සංඛ්‍යාවක් වෙසෙන රටකි. ( )

- **අංක 16-20 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුරු හිස්තැන මත ලියන්න.**

16. ආසියා මහාද්වීපය භූගෝලීය වශයෙන්..............................මහාද්වීපය සමඟ සම්බන්ධ වී පවතී.
17. මුහුදු මට්ටමට වඩා පහළින් පිහිටි.............................. පිහිටා ඇත්තේ ආසියා මහාද්වීපයේ ය.
18. භාෂා 297ක් පමණ භාවිතා වන ආසියාතික රට වන්නේ.............................. ය.
19. ටිබෙට් සානුව පිහිටා ඇත්තේ මුහුදු මට්ටමේ සිට අඩි .............................. ක් පමන උසිනි.
20. යුරල් ගංගාව ගලා බසිනුයේ.............................. මුහුදට ය. (ල.2 x 20 =40)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 9 – First Term Test – April 2019

පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 9 ශ්‍රේණිය

## Geogaphy– II

භූගෝල විද්‍යාව– II

Name :- ................................................... Grade : -................ Index number:-....................

### II කොටස

- ❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5ට පිළිතුරු ලියන්න.

1. පහත ප්‍රශ්නවලට පිළිතුරු දී ඇති සිතියම ඇසුරින් සපයන්න.

(i) A අක්ෂරයෙන් දැක්වෙන අභ්‍යන්තර මුහුද වන්නේ කුමක් ද?

..................................................................................................................

(ii) ලෝකයේ අධික ජන සංඛ්‍යාවක් වෙසෙන B අක්ෂරයෙන් දැක්වෙන රට කුමක් ද?

..................................................................................................................

(iii) බෙංගාල බොක්ක දක්වා ඇති අක්ෂරය කුමක් ද?

..................................................................................................................

(iv) E අක්ෂරයෙන් දැක්වෙන රටෙහි ප්‍රධානතම කර්මාන්ත ක්ෂේත්‍රය කුමක් ද?


..................................................................................................................

(v) F අක්ෂරයෙන් දැක්වෙන රටෙහි ජීවත් වන ප්‍රධාන මානව වර්ගය කුමක් ද?

..................................................................................................................

(vi) චීනය හරහා ගලා බසින D අක්ෂරයෙන් දැක්වෙන ගංගාව නම් කරන්න.

..................................................................................................................




Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

2. (i) නිරපේක්ෂ පිහිටීම යනු කුමක් ද? (ල.03)
   (ii) ආසියාව යුරෝපයෙන් හා අප්‍රිකාවෙන් වෙන්වන මායිම් 4ක් ලියන්න. (ල.04)
   (iii) a. ලෝකයේ රටවල් අතර ජනගහනය අසමාන ලෙස ව්‍යාප්ත වීමට බලපා ඇති හේතු 3ක් ලියන්න.
   b. ඉන් එක් හේතුවක් කෙටියෙන් විස්තර කරන්න. (ල.02)

3.
   (i) ඉන්දියාව උපමහාද්වීපයක් ලෙස සලකන්නේ ඇයි? (ල.03)
   (ii) ආසියා මහාද්වීපයේ පිහිටි සානු 4ක් නම් කරන්න. (ල.04)
   (iii) ආසියානු ප්‍රදේශයේ භෞතික හා මානුෂ වශයෙන් සුවිශේෂී ලක්ෂණ රැසක් ඇත. ඒවා අතරින් භෞතික ලක්ෂණ 3ක් හා මානව ලක්ෂණ 2ක් වෙන් වෙන්ව ලියන්න. (ල.05)

4. (i) ලෝකය බෙදෙන ප්‍රධාන දේශගුණික කලාප තුනෙන් දෙකක් නම් කරන්න. (ල.05)
   (ii) ඔබ සඳහන් කල එක් දේශගුණික කලාපයක ඇති උපදේශගුණික වර්ග 2ක් ලියන්න. (ල.03)
   (iii) (a) ප්‍රධාන දේශගුණික කලාප තුළ එකිනෙකට වෙනස් දේශගුණ වර්ග ඇතිවීමට බලපාන හේතු 3ක් ලියන්න. (ල.03)
   (b) ඔබ සඳහන් කළ එක් කරුණක් කෙටියෙන් විස්තර කරන්න. (ල.02)

5. (i) පාකිස්ථානයේ ප්‍රධාන වගා කන්න 2ක් ලියන්න. (ල.03)
   (ii) පාකිස්ථානයේ නිෂ්පාදන 4ක් ලියන්න. (ල.04)
   (iii) (a) කෘෂිකාර්මික රටක් ලෙස පාකිස්ථානයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ 3ක් ලියන්න. (ල.03)
   (b) ඉන් එක් ලක්ෂණයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.03)

6. (i) ජපානයේ ඇති පෙට්‍රෝ රසායන කර්මාන්ත 2ක් ලියන්න. (ල.02)
   (ii) ජපානය ජෛවතාක්ෂණය උපයෝගී කරගන්නා ක්ෂේත්‍ර 4ක් ලියන්න. (ල.04)
   (iii) (a) ජපානයේ ප්‍රධාන මෝටර් රථ නිෂ්පාදන සමාගම් 3ක් ලියන්න. (ල.03)
   (b) ජපානයේ විදුලි උපකරණ හා ඉලෙක්ට්‍රොනික් උපකරණ නිෂ්පාදනයේ ප්‍රමුඛ සමාගම් 2ක් ලියන්න. (ල.02)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk